## නීතියක් ඇති රටක්

ටෝනි ඇබට් අපේ හිටපු අගමැතිතුමා මාර ස්පෝට් පොර නෙ. මොකක්ද කරුමෙකට අර අපේ රටේ වගේ ජල්තර ක්‍රමයකට මෙහේ කට්ටිය ගේමක් දීලා මනුස්සයාව පිටිපස්සෙ බංකුවට දැම්මනෙ. එතෙන්ට ගියාට මේ ආණ්ඩුව ඇත්තටම බලයට ගෙනාවේ ඇබට් තමයි. එහෙම උනත් පස්සට ගිය දා ඉඳලා ඉඳල හිටල චූටි වලියක් දෙකක් දැම්මට අර කියනව වගේ හෙට ආණ්ඩුව පෙරළනවා තව පෝය දෙකයි අරකයි මේකයි කියලා ආණ්ඩුව කරන හැම වැඩේම බකල් කරන්න උත්සාහ ගන්නෙ නැති එක එකට මෙන්න චූටි මල්ලිගේ මෙච්චා එක. ගත්ත නම් කරපල්ලා අවුරුදු 4 කින් හම්බුවෙමු තියරියේ මිනිහා ඉන්නේ. අන්න ඒකයි ක්‍රමේ මල්ලි.



එහෙව් මනුස්සයට අතට අත දෙන්න ගිය වෙලාවෙ කව්ද පිස්සෙක් හෙඩ් බට් කළා කියලා ආරංචි උනා. ඊළඟ නිවුස් එක වෙන්න ඕනෙ හෙඩ් බට් කරපු එකාගෙ හෙඩ් එක නැතුව කඳ පාරේ තිබුණා කියන එක. ඒකනෙ අපට පුරුදු. එච්ච කොහෙද මෙහේ. අනේ ඇබට් කරන්නේ පොලිසියේ ඇන්ට්‍රි එකක් දාන එක. හෙඩ් බට් කරපු එකාගෙ අත පය වත් කුඩු කරලා නැහැ කියලා දැනගත්තම අපිත් සලිත වෙනවා. පේනව නේද ලොක්කා නීතිය රැකෙන රටේ පුරවැසියන් නීතිය සුරකින හැටි?

රටකට සිස්ටම් එකක් ක්‍රමයක් අවශ්‍යයි. ඒ වගේම ඒ සිස්ටම් එක ඇතුළෙ ජීවත් වෙන්න මිනිස්සු පුරුදු කරන්නත් ඕනෙ. ඒව මේ දඩ ගහලා හිරේ දාලා කරන්න පුලුවන් දේවල් නෙවෙයි. ඒවා හික්මීම තුළින් ගොඩ නැගෙන දේවල්. සිස්ටම් එකක් ගොඩ නගන්න පරම්පරා දෙකක් වත් යනවා. එක කොටසක් අමාරුවෙන් ගොඩ නගපු සමාජ ක්‍රමයක් තුළ තමයි අපිත් මේ ජීවත් වෙන්නේ. වරප්‍රසාද භුක්ති විඳින්නෙ. ඒ නිසා කට්ටිය මේ සිස්ටම් එක ආරක්ෂා කරගන්න අපේ හැකි පමණ දායකත්වය දෙන්න හැම විටම උත්හාස ගමු.

## පිස්සු පීකුදු

මිනිස්සු සියදිවි හානි කරගන්න එක අපි අහල දැකල තිබුණත් ඒක දැන් පෙර නොවූ විරූ පමණට වර්ධනය වෙමින් තියෙනවා. පහුගිය දවස් වල එල්ලිලා මැරුණු නලුවගේ කතන්දරේ නිසා ඒක යළිත් මාතෘකාවක් බවට පත්වෙලා සමාජය තුළ බරපතල විදිහට.

මැරෙන උන් දැන් මැරෙන්නෙ මැරෙන විදිහ ජීවත්වෙලා ඉන්න මිනිස්සුන්ට පේන්න රූපගත කරලා. ඒකෙන් බලාපොරොත්තුවෙන්න මොකක්ද? මැරෙන්න ඕනෙ නම් ලියුමක් එස්එම්එස් එකක් ලියලා මැරෙන්න පුලුවන්නෙ. මොකක්ද ඒක රූපගත කරලා බලාපොරොත්තුවෙන්නෙ? බලන එවුන්ට මොකක්ද ඒකෙන් ලැබෙන්නෙ?

අපි නම් සියදිවි නසාගන්න එකට විරුද්ධයි. එහෙම මැරෙන උන්ට දෙන ප්‍රචාරයටත් විරුද්ධයි. මොකද මේ ලෝකේ නිකම් මැරෙන්න සාධාරණ හේතුවක් නැති නිසා. අනෙක සියදිවි නසා ගන්නවා කියන්නේ පට්ටම ගොන් වැඩක්. මේක ඇත්තටම රෝගයක් නෙවෙයි. ප්‍රවණතාවක් වගේ වගේ එකක් කියලා මට නම් හිතෙන්නෙ. මැරෙන තරමක් මැරෙන්නෙ ඉහළ අධ්‍යාපනයක් ඇති භෞතික වශයෙන් සාර්ථකත්වයට පත්වෙච්ච මිනිස්සු වෙන එකනේ කාල ඉන්න බැරි. හේන් ගොවියෙක් නම් වී ගොවියෙක් නම් කමක් නැහැ කියමු විසඳගන්න බැරි තරම් ආර්ථික ප්‍රශ්න නිසා කියලා. ඒත් අනෙක් අය?

මේක හරිම සංකීර්ණ ප්‍රශ්නයක්. මේකට නම් විසඳුම් සෙවිය යුතුමයි. මට නම් හිතෙන්නෙ හැමෝම කියනව වගේ අපේ අධ්‍යාපන ක්‍රමයතුළ ජීවත්වෙන්න උගන්වන්නෙ නැති එකයි කියන එකවත් උගන්වන්නෙ ඉහළ යන ක්‍රමේ විතරයි කියන එකවත් අභියෝග වලට මුහුණ දෙන ක්‍රමය අපේ අධ්‍යාපනය තුළ උගන්වන්නෙ නැහැ කියන එකවත් නෙවෙයි. එච්චර දුර ගිහින් කාලය කා දමන්න දෙයක් නැහැ. කරන්න තියෙන්නෙ බොහොම සුලු දෙයයි. මැරෙන්න හිතා ගෙන ඉන්න අයට දන්වන්න ඕනෙ මැරුණ එකාගෙ කටේ විතරයි පස් කියලා. පේන්නැද්ද මේ වාහෙලා මැරුණ එවුන්ව විකුණාගෙන කත අපූරුව. පට්ටන්දරේ ඉපදුන තැන ඉඳලා මැරිලා හත් දවසේ දානෙ වෙනකල් අඩියරෙන් අඩියරට විකුණාගෙන ගොඩ යන ලස්සන. ඔන්න ඕවයි මිනිස්සුන්ට හැබෑ ලෙසම උගන්නන්න ඕනෙ.

## රට ගිනි තියන්න එපා



ලංකාවෙ ප්‍රශ්න ගැන චූටි මල්ලි කතා කරන්න කැමති නැති වුණත් FB එක ලෝකෙටම පොදු නිසාත් ඒකට අපේ මුහුණුත් සම්බන්ධ වන නිසාත් රෝහින්ගා සරනාගත ප්‍රශ්නය ගැන නෙවෙයි ඒකට අදාල බාහිර කාරනාවක් ගැන අදහසක් දක්වන්න කැමතියි.

මාද්‍ය කියවනවා නම් අන්තර්ජාලේ හැසිරෙන මල්ලිලාට නංගිලාට රොහින්ගා අනාථයෝ ආවේ කවදද ගියේ කවදද ඉන්නේ කී දෙනාද කියලා අමුතුවෙන් කියලා දෙන්න දෙයක් නැහැ. පොඩි එකෙකුට වුණත් ගණන් කරන්න පුලුවන් ගාණක් ඒක. ඒත් ඒක දඩමීමා කරගෙන රටක් අවුලුවන්න ජාතියක් ගිනිගන්න දේවල් කරන්න දායක වෙන්න එපා මල්ලිලා.

අපිත් එෆ්බී එකේ ඉන්න නිසා දන්නවා එක එක්කෙනාගෙ දේශපාලන ඇජෙන්ඩා වලට අසත්‍යය පතුරවලා කරන කැම්පේන් එක. ඒක හරි අසාධාරණයි මල්ලිලා. මේ කියන්නෙ එහෙයි මෙහෙයි දෙගොල්ලන්ටම. හජ්ජි ගිහිල්ල ආපහු ලංකාවට එන මුස්ලිම් මිනිස්සුන්ගෙ පරණ ෆොටෝ හදලා ඊයෙ පෙරේදා ලංකාවට ගොඩ බහින මුස්ලිම් මිනිස්සු හැටියට ලංකාවෙ මිනිස්සුන්ට පෙන්නන්න දරන කැත උත්සාහයට අපි විරුද්ධයි. මොකා බලයේ හිටියත් වෙන්නේ මොනවද කියලා අපිට අවබෝධයක් තියෙනවා. අපි අවුරුදු 30 ක යුද්ධයක දුක විඳපු මිනිස්සු. ඒක ඉවරවුණා විතරයි හොර



ගණයන්ගෙ ගැට වලට අහුවෙලා මෝඩ ගොන් වැඩ කරලා පස්සෙ දුක් වෙන්න එපා. ඒවායේ ප්‍රතිඵල දැකලා අමතක කරන්න එබා. මොන ප්‍රශ්න අපි අතරෙ තිබුණත් ඉතිහාසය පුරාම අප සමග හිටියෙ මුස්ලිම් ජනතාව බව. ඒක සියවස් ගණනාවක් පැරණි සම්බන්ධතාවක්. චූටි මල්ලිට දුක ඒකයි.

## Yes or NO

සමරිසියන්ගෙ අයිතීන් පිලිබඳව ජනතා මතය විමසන ජනමත විචාරණය දැන් පැවැත්වෙනවා. ජනතා අයිතීන්ගේ නිදහස පිළිබඳ තීරණ වලට ආණ්ඩුව බලහත්කාරකම් කරනවාට වඩා මැදිහත් වී කටයුතු කරන මේ ක්‍රමයට චූටි මල්ලි මනාපයි. ආ-



ණ්ඩුවක් පොදු පහසුකම් සපයන්නාගේ තනතුර හැම විටම උසුලනවා නම් බොහොමයක් ප්‍රශ්න - ප්‍රශ්න නොවී විසඳාගන්න පුලුවන්.

කෙහොම උනත් මේ මත විමසුම සම්බන්ධයෙන් අපේ පරම්පරාව තුළ පවතින්නෙ සෘණ ආකල්පයක් බවයි පේන්නෙ. කොටින්ම කියනවා නම් දෙමව්පියෝ බහුතරය No වන විට දරුවන්ගේ බහුතරය Yes. මේකත් අර පරම්පරා ගැටුමට ලඝු කරන්න හදනවා නම් ඒක මෝඩ කමක්. අපි කොහොම හිතුවත් ළමයි හිතන්නේ අපට වඩා ඉදිරිගාමීව. ඒ ඔවුන් වැඩුණ පරිසරය විසින් ඔවුන්ට බලා දෙන ලද දෙයයි. මම කතා කරපු බොහෝ දෙනෙක් තුළ තියෙන්නේත් ඔවුන් මෙය දකින්නේ මහා ව්‍යාසනයක් විදිහට. මේ මත විමසුම හරහා රකින්නට යන ජනතා නිදහස් තීරණ ගැනීමේ අයිතිය පිලිබඳව ළමයින්ට ලොකු අවබෝධයක් තිබෙන බව පේනවා. අපිත් මේක ඉස්සර නම් දකින්නේ ඒ ගතානුගතික විදිහටම තමා. කොහොම උනත් අම්මලා තාත්තලා NO කිව්වත් ළමයි YRS කියන නිසා ඔස්ට්‍රේලියානු සමාජය ඉදිරියට යාවි. ළමයි මිනිස්සු වෙනකල් ඒ අයිතීන් සුරැකී තියේවි.

පිරිමි පිරිම සමග එක්වන එකත් ගැහැනු ගැහැනු සමග එක්වීමත් තාවකාලික ප්‍රවණතාවක් පමණයි. අස්වාභාවික දේවල් ඉතිහාසය පුරාම ඒ ඒ වකවානුවල දකින්නට ලැබෙනවා. ඒව ඔහොම තමයි. මල්ලි ඕව ඔහොම තමයි.

## දෙයියන්ගෙම පිහිටයි

කාලෙකට පස්සෙ ලංකාවෙ ක්‍රිකට් ටීම් එක යාන්තම් ටෙස්ට් මැච් එකක් දින්නා. මෙන්න බොලේ දින්නා විතරයි ඒකෙ ගෞරවය ගන්න කොහෙදෝ ඉන්න මෑනි කෙනෙක් ඉස්සරහට ඇවිත්. අපේ ක්‍රිකට් නායක චන්දිමාල් තරගයට යන්න කලින් එයාගෙ ආශිර්වාදය අරගෙන ගියා කියලා එකට ඉන්න පින්තූරත් දාලා.



පළවෙනි කාරණේ එහෙම ගියා නම් චන්දිමාල් කියන්නෙ කායි තරම් ආත්ම විශ්වාසයක් නැති නායකයෙක්ද කියන එක ඒකෙන් පේනවා.

දෙවෙනි කාරනේ ලංකාවෙ මිනිස්සු මොන තරම් අන්ධ විශ්වාස වල පැටලිච්ච ජාතියක්ද කියන එක ඒකෙන් පේනවා.

මේක ව්‍යසනයක්.

පහුගියදා පැවති පහේ පන්තියේ ශිෂ්‍යත්ව විභාගයට කලින් පොඩි දරුවන් ඇදගෙන පල්ලි පන්සල් කෝවිල් ගිය දෙමාපියන් දැක්කම චූටි මල්ලිට නම් හිනා. දෙවියෝ විභාග පාස් කරලා දෙනවා නම් මේ ඔක්කොම ළමයි විභාගෙන් පාස් වෙලා තියෙන්න ඕනෙනෙ. එහෙම වෙන්නෙ නැති වුනාම වත් මේවා බොරු වැඩ කියලා තේරුම් ගන්න ඒනෙ නේද? හැම දේටම පඬුරු ගැට ගහලා දේව ආශිර්වාදය ඉල්ලට ඉංජිනේරුවන් දොස්තරලා ආචාර්ය මහාචාර්යවරු ඉන්න රටේ පොඩි මිනිස්සු ගැන මොන කතාද?

**චූටි මල්ලි**